**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.07.27 පැය 0820 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1469 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජන මාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. ව්‍යාජ ලේඛන සකස් කළ සැකකරුවෙකු ව්‍යාජ ලේඛන සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.07.26 වන දින දහවල් කාලයේ කොච්චිකඩේ පොලිස් වසමේ දළුවකොටුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ව්‍යාජ දේශීය හා විදේශීය ගමන් ලබපත්‍ර, ව්‍යාජ රියදුරු පලපත්‍ර, ව්‍යාජ හැඳුනුම්පත්, විදෙස් රටවල ව්‍යාජ වීසා බලපත්‍ර, ව්‍යාජ ලිපි ලේඛන සකස් කිරීමට යොදා ගන්නා උපකරණ, කිලෝ 01 ග්‍රෑම් 500 ක් බරැති විවිධ වර්ගයේ රත්‍රං ආභරණ සහ මුදල් රුපියල් 26,500,000/= සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 60 ක් වන දළුවකොටුව, කොච්චිකඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වැඩිදුර විමර්ශන සිදු කරනු ලබනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුර.**

2025.07.26 වන දින සවස් කාලයේ අහුංගල්ල පොලිස් වසමේ අහුංගල්ල හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මලිග්‍රෑම් 500 ක් යතුරුපැදියකින් ප්‍රවාහනය කරමින් සිටියදී යතුරුපැදිය සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අහුංගල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන අහුංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අහුංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**03. නීති විරෝධි දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.**

2025.07.26 වන දින සවස් කාලයේ මතුගම පොලිස් වසමේ සෙන්ට්‍රල් හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි දුම්වැටි 3020 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මතුගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 54 ක් වන මතුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මතුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**04. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් සිදු කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වච්නතිව් කඳවුර.**

2025.07.26 වන දින දහවල් කාලයේ කරදියනාරු පොලිස් වසමේ කෝපාවලි ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වච්නතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මුන්දෙනිආරු ඇලේ බලපත්‍ර නොමැතිව වැලි කැණීම් සිදු කළ සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයක් සමඟ අත්අඩංගුවට** ගෙන කරදියනාරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 21 ක් වන නෙඩියමඩු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**